# ලංකා බැංකුව

**ශ්‍රී ලංකාවේ අංක 01 බැංකුව සමග එක්වී ඩිජිටල් අලෙවිකරණ ඒකකයෙහි පෙරමුණ ගන්න**

ලංකා බැංකුවෙහි ඩිජිටල් අලෙවිකරණ ඒකකයෙහි කොටස්කරුවකු වීමට කැමති සුදුසුකම් සහිත තරුණ, ජවසම්පන්න සහ ප්‍රතිඵල කරා දිශාභිමුඛ වූ පුද්ගලයන්ගෙන් පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

# ඩිජිටල් අලෙවිකරණ කළමනාකරු

## (කොන්ත්‍රාත් පදනම)

## රැකියා විස්තර

1. භාෂාත්‍රයෙන්ම බැංකුවෙහි වෙබ් අඩවිය සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම සම්පූර්ණයෙන්ම අධීක්ෂණය කිරීම
2. බැංකුවේ ඩිජිටල් ක්‍රමෝපාය සකස් කිරීම
3. ඩිජිටල් අන්තර්ගත සැලසුම ක්‍රමෝපායිකව සකස් කිරීම හා එය වෙබ් අඩවියෙහි සහ සමාජ මාධ්‍යවල කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම
4. ප්‍රවනතාවන් අධීක්ෂණය කර වෙළඳපොළ තත්වයන්ට අනුවර්තනය වන ලෙස ඩිජිටල් ක්‍රමෝපාය ප්‍රශස්ත මට්ටමින් යොදා ගැනීම
5 තරගකරුවන්ගේ ක්‍රියාකාරකම් සමීපව අධීක්ෂණය කර අවශ්‍ය නිර්දේශ සිදුකිරීම හා වඩාත් සුදුසු දේ සිදු කිරීම
6. ඩිජිටල් සන්නිවේදනය ගැලපෙන ආකාරයට භාෂාත්‍රයෙන්ම සිදුවන බවට වගබලා ගැනීම
7. වෙළඳපොළෙහි මතුවන නව ප්‍රවනතාවන් සමග කාර්යක්ෂමව අන්තර්ගත නිර්මාණය සම්බන්ධීකරණය කිරීම
8. බැංකුවේ ඩිජිටල් නාලිකා කළඹෙහි අවශ්‍ය ඩිජිටල් අන්තර්ගතය කාලීනව යාවත්කාලීනකරණය වන බවට වගබලා ගැනීම
9. ඩිජිටල් මාධ්‍ය සන්නිවේදන විධිමත් කිරීමට අභ්‍යන්තර පාර්ශවකරුවන් සමඟ සබඳතාව පවත්වා ගැනීම
10. ඩිජිටල් අලෙවිකරණයේ ප්‍රතිලාභයන්ට උත්තෝලනයක් ලබා දීමට බැංකුවේ ඩිජිටල් නිමැවුම්වලට සහායවීම
11. අදාළ නියෝජිත ආයතනයේ සහාය ඇතිව අඛණ්ඩ සෙවුම් යන්ත්‍ර ප්‍රශස්තකරණ (Search Engine Optimization - SEO) ප්‍රයත්න සිදුකිරීම හා වෙබ් අඩවියේ පරිශීලනය වර්ධනය කිරීම සහ සමාජ මාධ්‍ය සම්බන්ධතාව සහතික කර ගැනීම
12. ආයෝජන සම්බන්ධතාව සහ සේවායෝජක සන්නාමකරණය සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය සහිතව ඩිජිටල් අලෙවිකරණ කටයුතු ක්‍රමෝපායිකව සකස් කිරීම

## යෝග්‍යතා නිර්නායක

➢ ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.

➢ **සුදුසුකම්**

- අලෙවිකරණය හෝ කළමනාකරණය හෝ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබිය යුතුය. අදාළ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- ගූගල්, ෆේස්බුක් සහ ඩිජිටල් අලෙවිකරණ වෙතින් සුදුසු බවට ලබාදෙන සහතික කිරීම් සතු අය සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

➢ **පළපුරුද්ද**

- අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද තිබිය යුතුය

➢ **වෙනත් සුදුසුකම්**

- ඕනෑම භාෂා දෙකක් ව්‍යක්ත ලෙස හැසිරවීමේ හැකියාව තිබිය යුතුය. (සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ)
- වෙබ් අඩවි, සමාජ මාධ්‍ය හා අදාළ විෂය පථයන් පිළිබඳ මනා අවබෝධයක් හා ක්‍රියාකාරී දැනුමක් තිබිය යුතුය

➢ **වයස**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 45 හෝ ඊට අඩුවිය යුතුය.

## නියමයන් සහ කොන්දේසි

- කාර්ය සාධනය මත පදනම්ව වාර්ෂිකව අලුත් කිරීමට යටත්ව මුළු කොන්ත්‍රාත් කාල සීමාව වසර 03 කි.
- අයදුම්කරුගේ පැතිකඩ මත පදනම්ව ආකර්ෂණීය වේතනයක් ගෙවනු ලබන අතර, එය සාකච්ඡා කර තීරණය කළ හැක.

## අයදුම් කිරීමේ පටිපාටිය

ඔබගේ යාවත්කාලීන කරන ලද ජීව දත්තපත, පරිලෝකනය (Scan) කරන ලද උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, අධ්‍යාපන සුදුසුකම්වලට අදාළ සහතික සහ පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලේඛන සමග ඔබ පිළිබඳව විස්තර ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ඇමතුම් විස්තරද ඇතුළත් කර 2021 සැප්තැම්බර් මස 25 වන දින හෝ ඊට පෙර ඔබ අයදුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කර "careers@boc.lk" විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය.

*ඉහත සඳහන් යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදාළ සහතිකවල පරිලෝකනය (Scan) කරන ලද පිටපත් නොමැති හෝ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

**මානව සම්පත් අංශය,**
**ප්‍රධාන කාර්යාලය,**
**ලංකා බැංකු, කොළඹ 01.**

*කිසිදු අයුරකින් හෝ බලපෑම් කිරීම වහාම නුසුදුසුභාවයට පත් කිරීමට හේතුවේ.*
*තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.*